අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 Fax +94112784846
isurupaya@moe.gov.lk www.moe.gov.lk


මගේ යොමුව / எனது இல. / My Ref. ED/05/67/28/05 | ඔබේ යොමුව / உமது இல. / Your Ref. | දිනය / திகதி / Date 2019.03 13

සියළුම පීඨාධිපතිවරුන් / විදුහල්පතිවරුන් / ගුරු විදුහල්පතිවරුන්

ගුරු මධ්‍යස්ථාන කළමනාකාරවරුන්,

**අධ්‍යාපන අමාත්‍යාංශයෙන් පත් කරන ලද අනධ්‍යයන කාර්ය මණ්ඩලවලට අයත් නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු අභියාචනා - 2018**

මාගේ සමාංක හා 2019.01.22 දිනැති ලිපිය මඟින් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් පත් කරන ලද අනධ්‍යයන කාර්ය මණ්ඩලවලට අයත් නිලධරයන්ගේ 2019 වර්ෂය සඳහා සිදු කරන ලද වාර්ෂික ස්ථාන මාරුවීම් යෝජනා හා බැඳේ.

02. එම ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් සමාලෝචන කමිටුවේ තීරණ මේ සමඟ ඉදිරිපත් කර ඇති අතර එය www.moe.gov.lk වෙබ් අඩවියේ ද පළ කර ඇත.

03. මෙම සමාලෝචන කමිටුවේ තීරණ අනුව වෙනසක් නොවන සියලුම ස්ථාන මාරුවීම් වාර්ෂික ස්ථාන මාරු යෝජනාවන්හි සඳහන් කර ඇති 2019.03.15 දින සිට ක්‍රියාත්මක වේ. ඒ අනුව අනුප්‍රාප්තිකයන් සේවයට වාර්තා කරන තෙක් නොසිට ස්ථාන මාරුවීම් වලට යටත් සියලුම නිලධරයන් අදාළ දිනයේ නව සේවා ස්ථානවල රාජකාරී භාර ගැනීමට හැකිවන සේ වර්තමාන සේවා ස්ථානයෙන් 2019.03.14 දින සේවයෙන් පසු මුදා හැරීමට කටයුතු කරන ලෙස ද කාරුණිකව දන්වමි.

04. වාර්ෂික ස්ථාන මාරු නියෝගයක් මත නියමිත පරිදි ස්ථාන මාරු ලැබූ නිලධරයෙකු නව සේවා ස්ථානය වෙත රාජකාරී සඳහා වාර්තා නොකර සිටින අවස්ථාවකදී එම නිලධරයා ස්ථාන මාරුව ලබා ඇති සේවා ස්ථානයේ ප්‍රධානියා විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති 217 වගන්තිය අනුව සේවය හැර යාමේ නිවේදනය නිකුත් කිරීමට කටයුතු කළ යුතුය.

05. **වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා මාගේ නිර්දේශය සහිතව ඉදිරිපත් කළ යුතු වේ. ඒ සඳහා, මේ සමඟ අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ පල කර ඇති ආකෘති පත්‍ර අංක - 5A සම්පූර්ණ කර 2019.03.30 දිනට පෙර මා වෙත ඉදිරිපත් කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.**

එච්. හේවගේ
අතිරේක ලේකම් (පාලන)
අධ්‍යාපන ලේකම් වෙනුවට

පිටපත - ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව - කරු.දැ.ගැ.ස. / අ.ක.ස.